**ටවර්හෝල් රඟහල පදනම - 2018**

**----------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ටවර්හෝල් රඟහල පදනමේ 2018 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව ඉකුත් වර්ෂවල වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු.271,702,335 ක් රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයටද, රු.4,018,000 ක් ජපන් රජයෙන් ලද උපකරණ පරිත්‍යාග වටිනාකමටද රු.276,798,877 ක් සමුච්චිත අරමුදලටද ගලපා තිබුණි. එසේ වුවත් එම ගැලපීම් තුලින් සිදුවූ බලපෑම අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ සංසන්දනාත්මක ශේෂ නැවත ප්‍රතිෂ්ඨාපනය කර මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අඩුපාඩුව ඉදිරියේදී නිවැරදි කර අදාල ආකෘති භාවිතා කිරිමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණය කිරීම් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සවිසිරිපාය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පදනමකින් තොරව නාමිකව අයකිරීමට එකඟ වී තිබුණු රු.200,000 ක බදු කුලිය ලැබිය යුතු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. එම නිසා වර්ෂයේ ආදායම සහ ලැබිය යුතු බදු කුලී ආදායම් එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විණි. | දෙපාර්ශවය අතර නිශ්චිත එකගතාවයක් ඇති කරගෙන නොමැති බැවින් මෙය ගිණුම් ගත කර නොමැත | පදනම සතු වත්කම් පරිහරණය කිරීමේදී විධිමත් ගිවිසුම්වලට එළඹිය යුතු අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන, මුදල් පරිත්‍යාග ලැබීම් සහ භාණ්ඩ පරිත්‍යාග සංචිත යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද මෙම සංචිත ශේෂයන් පිළිබඳ විස්තර හෝ මෙම ශේෂයන් සංචිත ලෙස ගිණුම්ගත කිරීමට පදනම් කරගත් උපයෝගී ලියවිලි කිසිවක් විගණනයට | 78,467,860 | ලදුපත්,බැංකු තැන්පතු පත්‍රිකා, භාණ්ඩ ලැබීම් පත්‍රිකා, පරිත්‍යාග ලේඛනය | මෙම ශේෂයන් වසර ගණනාවක් පොත්වල ඉදිරියට ගෙන එන ලද පැරණි ශේෂයන් වන අතර මෙම ශේෂයන් තහවුරු කර ගැනීමට අදාල ලිපි ගොනු හෝ අනෙකුත් ලියකියවිලි සොයා ගත නොහැකි බව | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පදනම් කරගත් සියලු උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| ඉදිරිපත් නොකෙරුණු බැවින් එම ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු ගිණුමේ ශේෂය රු.4,049,035 ක් වූ අතර එයින් වසරකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවති ශේෂය රු.1,652,321 ක් විය. මෙකී ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට පදනම විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ශේෂයන්ගෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් නිරවුල් කරගැනීමට නොහැකි වූ අතර ඒවා ද හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ | පදනමට ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 අංක 1 දරන ටවර්හෝල් රඟහල පදනම පනතේ 8 වෙනි වගන්තිය හා පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් | මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නාත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික | මෙම කටයුක්ත නිරවුල් කරගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතිනු ඇත | ටවර්හෝල් රඟහල පදනම පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,039,041 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,769,555 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,808,596 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයතන හා පරිපාලන වියදම් රු. 7,985,671 කින් වැඩිවීම සහ වෙනත් ආදායම් රු.7,654,660 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2018 | 2017 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 0.99:1 | 4.81 : 1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.89:1 | 4.75:1 |

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතැති මුදල් හා බැංකු ශේෂය සියයට 54.08 කින් අඩුවීම, තැන්පතු, ඉදිරි ගෙවීම් හා අත්තිකාරම් සියයට 96 කින් අඩුවීම, ණයහිමියන් හා උපචිත වියදම් සියයට 44.04 කින් වැඩිවීම ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය අඩුවීමට හේතුවී තිබුණි. තවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව ක්ෂණික වත්කම් අනුපාතයද අඩුවී තිබුණි. එම අනුපාත ප්‍රශස්ථ මට්ටම ඉක්මවා අඩුවී තිබුණ අතර තවදුරටත් එම අනුපාත අඩුවීම වැළැක්වීම සඳහා පදනම විසින් ක්‍රියා කළයුතුව පැවති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පදනම වෙත 1980 වර්ෂයේදී පවරා දී තිබුණු සව්සිරිපාය ගොඩනැගිල්ලෙහි කොටසක් 1986 වර්ෂයේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත අවුරුදු 30 ක බදුකරයක් සඳහා රු. 200,000 ක වාර්ෂික බදු පදනම මත ලබාදී තිබුණි. එම අවුරුදු 30ක බදුකරය 2016 මැයි 14 දින නිමවී තිබුණු බැවින් නැවත අවුරුදු 30 ක බදුකාලයක් සඳහා මෙකී දේපල රු.200,000 ක වාර්ෂික බදු කුලියක් මත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණි. නැවත දේපල බදු දීමේදී රජයේ තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන වර්තමාන ආර්ථික බදු කුලිය අයකිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම දේපල 2016 මැයි 15 දින සිට නැවත බදු දීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණේ 2019 මාර්තු 15 දින වන අතර එම අනුමැතිය ලබාදීමේදී රජයේ තක්සේරු වාර්තාවක් මත | ඉදිරියේදී මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරනු ඇත | පදනම සතු දේපල බදු දීමේදී රජයේ තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන වර්තමාන ආර්ථික බදු කුලිය අයකිරීමට කටයුතු කළ යුතු අතර භාරකාර මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිතව වීධිමත් ගිවිසුම්වලට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| බදුකුලිය සංශෝධනය කල යුතු බවත් පදනමට අවශ්‍ය ගොඩනැඟිලි ඉඩ පහසුකම් වැඩිකර ගැනීමට හැකිවන පරිදි ගිවිසුම්වලට එළඹිය යුතු බවටත් දක්වා තිබුණද එම කොන්දේසි ඇතුළත් කර ගිවිසුම් ඇති කර ගැනීමට පදනම කටයුතු කර නොතිබුණි. මේ අනුව කිසිදු අධිකාරී බලයක් නොමැතිව හා විධිමත් ගිවිසුමක් නොමැතිව මෙම ගොඩනැඟිලි නාමික බදු කුලියත් මත බදු දීම විගණනයේදී පිළිගත නොහැකි ප්‍රශ්නකාරී තත්ත්වයක් විය. | | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කලයුතු වුවද එම මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 04 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | භාරකාර මණ්ඩල රැස්වීමක් නොපවැත්වීම හේතුවෙන් අනුමැතිය සහිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කිසියම් මූල්‍ය වර්ෂයකට අදාළ මූල්‍ය ප්‍රකාශන ඊළග වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතුය. |

**4.2** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඇස්තමේන්තුගත වටිනාකම රු.4,330,000 ක්වූ වැඩසටහන් 08 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර ඇස්තමේන්තුගත වටිනාකම රු.13,468,400 ක්වූ වැඩසටහන් 04 ක් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රතිශතය සියයට 10 සිට සියයට 30 දක්වා පරාසයක පැවතුණි. | දේශපාලන අස්ථාවර තත්වය මත ආයතනය වරින් වර විවිධ අමාත්‍යාංශය යටතට පත්වීම, කිහිප අවස්ථාවකදීම අධ්‍යක්ෂ ජනරාල්වරු පත්කිරීම, තීරණ ගැනීම, ලිපි ලේඛන හා මුදල් වියදම් කිරීමේදී ඇති වූ දුෂ්කරතා නිසා බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසු විය. | වර්ෂය තුළ ක්‍රියාත්මක කළ හැකි තාත්වික සැලසුම් සකස්කිරීම හා ඒ අනුව ආයතනයේ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම සිදු කල යුතුය. |